# කොළඹ දිසා අධිකරණයේ දී ය.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102 වගන්තිය යටතේ නියෝගයක නොතිස්යක් පිළිබඳව වන කාරණයක් හා සම්බන්ධයෙනි.

කොළඹ 10. ශ්‍රී විපුලසේන මාවතේ
අංක 167/4 දරණ ස්ථානයේ
නිහාල් ශ්‍රී අමරසේකර

පැමිණිලිකරු

නඩු අංකය : 21819/එම්. ආර්.

- එරෙහිව -

1. කොළඹ 2 ස්ටේපල්ස් වීදියේ පිහිටි "විදුම්පාය" යන ස්ථානයේ සහ කොළඹ 5 කිරුළ පෙදෙසේ අංක 37 දරණ ස්ථානයේ ගාමිණී ලක්ෂමන් පීරිස්.

2. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ් කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර කොළඹ 1.

විත්තිකරුවන්

වර්ෂ 1999ක් වූ ජූනි මස 1 වන දින දිය.

ස්වකීය නීතිඥ, ද සිල්වා සහ පෙරේරා නාමය සහ විලාශය යටතේ නීති වෘත්තියේ යෙදී සිටින ජේ. ඩබ්ලිව්. ඩී පෙරේරා මගින් පෙනී සිටිනු ලබන පැමිණිලිකරුගේ පෙත්සමෙහි පහත සඳහන් අයුරු ප්‍රකාශ කෙරේ.

1. මෙම නඩුවේ ප්‍රශ්නගත සියළුම කාරණයන් හා සම්බන්ධයෙන්, ඔහුගේ සන්තකයෙහි හෝ බලය යටතේ පවත්නා හෝ පැවති සියළුම ලේඛණ 1වන විත්තිකරු විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් ප්‍රකාශ කරන ලෙසට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102(1) වගන්තිය යටතේ නියෝගයක් සඳහා පැමිණිලිකරු විසින් 99.04.28 වන දින අධිකරණයට ඉල්ලීමක් කරන ලදී.

2. එසේ කරන ලෙසට 1වන විත්තිකරුට විධාන කරමින් 99.04.29 දින අධිකරණය නියෝගයක් කළේය.

3. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102(2) ප්‍රකාර 1වන විත්තිකරු විසින් එම අධිකරණ නියෝගය ඉටු නොකරමින්, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 108 වගන්තියට අනුකූලතාවයකින් යුතු නොවුන විරෝධතා ප්‍රකාශයක් 1වැනි විත්තිකරු විසින් 99.05.21 දින ඉදිරිපත් කරන ලදී.

එබැවින්, පැමිණිලිකරු ගෞරවපූර්වකව අයැද සිටිනු ලබන්නේ ගෞරවනීය ඔබතුමාගේ

ඔබතුමාගේ අධිකරණය විසින් කාරුණිකව:

අ) 1වැනි විත්තිකරුට නොතිසියක් නිකුත් කරන ලෙසත්,

ආ) 1වැනි විත්තිකරුගේ විරෝධතා ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන ලෙසත්,

ඇ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 102(1) වගන්තිය යටතේ අධිකරණය විසින් කරනු ලැබ ඇති නියෝගය ඉටු කරන ලෙසට 1වන විත්තිකරුට විධාන කරමින් නියෝගයක් කරන ලෙසත්,

ඈ) නඩු ගාස්තු සහ,

ඉ) අධිකරණයට සුදුසු යැයි පෙනී යන වෙනත් එවැනි සහ වැඩිදුර සහනයන් ප්‍රදානය කරන ලෙසත්ය.

පැමිණිලිකරුගේ නීතිඥ.